බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

## සභා රැස්වීම

2013 ඔක්තෝබර් මස 08 වන දින කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 ඔක්තෝබර් මස 22 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.10.08 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 ඔක්තෝබර් මස 22 වන දින පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. **ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :**

"ලංකා විදුලිබල මණ්ඩලයේ වාර්ෂිකව සිදුවන අධික පාඩුව අවම කර ගැනීම සඳහා යැයි පවසමින් පසු ගිය අප්‍රේල් මස, විදුලි බිල වැඩි කරමින් එම පාඩුවට මුදල් මහජනතාවගෙන් අය කර ගැනිමට කටයුතු කරන ලදී. වර්ෂාව නොලැබීම නිසා ජලාශ හිඳීයාම හේතුවෙන් රටේ විදුලිබල අවශ්‍යතාවයෙන් සියයට 18 ක(18%) ප්‍රමාණයක් ජල විදුලිය මගින් විදුලිය නිපදවීමට සිදුවූ බවත්, පෞද්ගලික විදුලි බලාගාර මගින් වැඩි මිලට විදුලිය මිලදී ගැනීමට හා වෙනත් ක්‍රම මගින් විදුලිය නිපදවීමට ද සිදුවූ බවත් ප්‍රකාශ විය. දැනට මාස කීපයක සිට ඇද හැලෙන ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ජලාශ පිරී ඉතිරී ගොස් සියයට 85 ක (85%) විදුලිය නිපදවීම ජලවිදුලි බලාගාර මගින් සිදු වේ. එමනිසා වැඩි කරන ලද විදුලි බිල වහාම අඩු කර මහජනතාව වෙත සහන සලසන මෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි"

(යෝ/v (01)13/05 )

02. **ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :**

"වසර 30 ක් තිස්සේ කුරිරු යුද්ධයකින් බැටකමින්, අනාගතය ගැන සිතන්නටවත් නොහැකිව සිටි ශ්‍රී ලාංකික අපට අද මේ රට තුල කෙරෙන සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අතිශයින් සතුටු විය හැක. එනයින් බලන කල අපගේ අනාගත පරම්පරාව අපට වඩා වාසනාවන්තයන් යැයි හැඟෙන අතර, එම සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව අපට ද ආඩම්බර විය හැක.

එමෙන්ම නොබෝදා ජනතා අයිතියට පත්කල කොළඹ - දකුණ වරාය සංවර්ධන යෝජනා ක්‍රමය ආසියාවටම ආශ්චර්යයක් එක්කල ක්‍රියා දාමයකි. එයින් අප රටේ භූගෝලීය සිතියමේ හැඩය පවා වෙනස් වී ඇති අතර, ලෝකයේ නිෂ්පාදිත ඕනෑම විශාල නෞකාවකින් අප රටට සේවය ලබා ගැනීමටත්, ලෝකයේ ඕනෑම රටකට අපගේ වරාය හරහා සේවය ලබා දීමටත්, හැකියාව ලැබී ඇත. විවිධ බලාපොරොත්තු ඇති අය කෙලෙස විවේචනය කලත්, රටට ආදරය කරන අය මෙම සුවිශේෂී වූ ක්‍රියාදාමයන් අගය කළ යුතුය. රට රැක ගැනීමට කැපවූ ශ්‍රී ලාංකික පොදු ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා මෙවැනි වරායක් සකස් කර ජාතියට පවරා දීම පිළිබඳව අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත්, ගරු රෝහිත අබේගුණවර්ධන අමාත්‍යතුමාටත්, වරාය අධිකාරියේ සභාපතිතුමාටත්, මෙයට දායකත්වය දුන් සියළුම නිලධාරී හා සේවක මහත්ම මහත්මීන්ටත්, වෘත්තීය සමිති වලටත් මෙම කර්තව්‍ය දැක අගය කළ සියළු දෙනාටත් මෙම බස්නාහිර පළාතේ පලාත් සභාව සිය ස්තූතිය පළකරමින් ආශිර්වාදය පුද කර සිටියි."

(යෝ/V(01)/13/03)

## X . සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.10.08 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.